**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර**

**HISTORY**

**ඉතිහාසය**

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍ර - I



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ඉතිහාසය - I

## අ.පො.ස. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

**සැලකිය යුතුයි.**

i. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.
ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති වඩාත් පැරණිතම සාහිත්‍ය කෘතිය මින් කුමක්ද?

1. මහාවංසය 2. දීපවංසය 3. බෝධිවංසය 4. ධාතුවංසය

02. ශ්‍රී ලංකාවට නො පැමිණ මෙරට තොරතුරු ඇතුළත් කර වාර්තා සැකසූ කතුවරයා කවරෙක්ද?

1. හියුං සියැං භික්ෂුව
2. ඉබන් බතුතා
3. පාහියන් භික්ෂුව
4. පිල්ප්පස් බැල්ඩියස්

03. ඉතිහාසය හැදෑරීමට අවශ්‍ය සාහිත්‍ය මූලාශ්‍රය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. දීපවංසය තිබිය දී ම අඩුපාඩු වඩාත් අඩු කෘතියක් වශයෙන් මහාවංසය රචනා කොට ඇත.
2. ධර්ම ග්‍රන්ථ ලෙස සැලකෙන පූජාවලිය, සද්ධර්මාලංකාරය, ථූපවංසය ඉතිහාසය හැදෑරීමට ප්‍රයෝජනවත් නො වේ.
3. ඓතිහාසික කාල අනුපිළිවෙළ සකස්කර ගැනීමට සාහිත්‍ය මූලාශ්‍රය ප්‍රයෝජනවත් ය.
4. කතුවරයාගේ අරමුණ සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයේ දී වැදගත්ය.

04. ප්‍රාග් ඓතිහාසික ජනාවාස ස්ථාන අතුරෙන් "පහත රට තෙත් කලාපීය ලෙන්" දැක්වෙන පිළිතුර කුමක් ද?

A. බුන්දල B. පාහියන්ගල C.බටදොඹලෙන
D. අලිගල E. බෙල්ලන්බැඳි පැලැස්ස F. කිතුල්ගල බෙලිලෙන

1. ABD 2. AEF 3. BCE 4. BCF

05. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ පරිවර්තනයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. පිළිස්සූ මැටි වළං භාවිතය හා ස්ථිර ජනාවාස ඉදිකිරීම.
2. ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය හා තාවකාලික ජනාවාස ඉදිකිරීම.
3. යකඩ ලෝහ භාවිතයේ ආරම්භය හා ගල් මෙවලම් තාක්ෂණය දියුණු වීම.
4. ගල් මෙවලම් තාක්ෂණය වර්ධනය හා දඩයම් දිවිපෙවෙත.

06. මුල් ඓතිහාසික යුගයෙහි විවිධ වෘත්තිකයන් සහ විසූ ගම්මාන "අ" සහ "ආ" තීරුවල සඳහන් ය. නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. වඩුවන් | A. කේවට්ටගාම |
| 2. ධීවරයින් | B. කසීකාරගාම |
| 3. මැණික් කපන්නන් | C. මණිකාරගාම |
| 4. ගොවියන් | D.වඩ්ඪකීගාම |

1. ACBD 2. ADBC 3. DACB 4. DBCA

07. දේවානම්පියතිස්ස රාජ්‍ය සමය වන විට දේශපාලන බලය මෙරට මධ්‍යගත වීමේ අවශ්‍යතාව වර්ධනය වීමට හේතුව වන්නේ,

1. ඉන්දියානු සාගර කලාපයේ වර්ධනය වෙමින් තිබූ වෙළඳාම ය.
2. ප්‍රාදේශීය පාලකයින් අතර සුහදතාව ගොඩනැගීම ය.
3. අශෝක රජතුමා සමග පැවති දේශපාලන සබඳතා ය.
4. පරුමක වරුන්ගේ සහයෝගය ලබාගැනීමට ය.

08. රාජ්‍යත්ව සංකල්ප වර්ධනය වනවිට පුරාණ රජවරු භාවිත කළ "විරුදනාම" සහ එම "රජවරු" , "අ" සහ "ආ" තීරුවල සඳහන් ය. නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| " අ " තීරුව | "ආ "තීරුව |
|---|---|
| 1. අලකපය මහරජ | A. නිශ්ශංකමල්ල රජතුමා |
| 2. නර ඉසෙර | B. I වන කාශ්‍යප රජතුමා |
| 3. කාලිංග චක්‍රවර්ති | C. කුටකණ්ණ අභය රජතුමා |
| 4. මින්නේරි දෙවියන් | D. මහසෙන් රජතුමා |

1. BADC 2. BCAD 3. BCDA 4. BDCA

09. පහත සඳහන් වනුයේ මෙරට ශ්‍රේෂ්ඨ රජවරු ඉටුකළ සේවාවන් කිහිපයකි. එම රජවරු කවුරුන් දැයි පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(a) ශ්‍රී ලංකාව "වැව් බැඳි රාජ්‍ය" මෙන්ම "පෙරදිග ධාන්‍යාගාරය" බවට පත් කිරීම.

(b) ප්‍රාදේශික බලය හිමි කරගත් පරුමකවරුන් ඒකාබද්ධකර ගැනීම.

(c) මෙරට දිගම සෙල්ලිපිය මෙන්ම වැඩිම සෙල්ලිපි සංඛ්‍යාවක් කරවීම.

1. වසභ රජතුමා, මහා පරාක්‍රමබාහු රජතුමා, නිශ්ශංකමල්ල රජතුමා
2. නිශ්ශංකමල්ල රජතුමා, වසභ රජතුමා, මහා පරාක්‍රමබාහු රජතුමා
3. 1 වන පරාක්‍රමබාහු රජතුමා, දුටුගැමුණු රජතුමා, නිශ්ශංකමල්ල රජතුමා
4. දුටුගැමුණු රජතුමා, 1 වන පරාක්‍රමබාහු රජතුමා, 1වන විජයබාහු රජතුමා

10. ඓතිහාසික සෙල්ලිපියක සඳහන් පරිදි දකුණු ඉන්දියාවේ 'චේර' රාජ්‍යයට ගොස් පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගී වූ රජතුමා කවුරුන් ද?

I. පළමු ගජබාහු රජතුමා
II. කනිට්ඨතිස්ස රජතුමා
III. පණ්ඩුකාභය රජතුමා
IV. I විජයබාහු රජතුමා

11. පුරාණයේ යකඩ නිස්සාරණ තාක්ෂණයේ දී උදුන් දැල්වීමට **ස්වාභාවික සුළං බලය** යොදාගත් ස්ථානය කුමක් ද?

1. ඌව පළාතට අයත් බෙරගල
2. සබරගමු පළාතට අයත් සමනළ වැව
3. මධ්‍යම පළාතට අයත් දෙහිගහ ඇළකන්ද
4. මධ්‍යම පළාතට අයත් සීගිරිය පොතාන

12. පැරණි සමාජයේ මිනුම සඳහා අදාල ''ඒකක'' සහ ''භාවිතය'' , "අ", "ආ" තීරුවල දක්වා ඇත. එම තීරු නිවැරදි ව ගැළපූවිට ලැබෙන පිළිතුර තෝරන්න.

| " අ " තීරුව | " ආ " තීරුව |
|---|---|
| 1. අක | A. කෙටි දුර මැනීම |
| 2. කරීස | B. දිග දුර මැනීම |
| 3. ආංගුලය | C. බර මැනීම |
| 4. උසබ | D. අවකාශය මැනීම |

1. CBAD 2. CDAB 3. CDBA 4. DABC

13. පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරින් I වන විජයබාහු රජතුමා හා සම්බන්ධ සිදුවීම් පමණක් දක්වා ඇති පිළිතුර තෝරන්න.

A. චෝළ පාලකයින්ට විරුද්ධව කටයුතු කිරීම.
B. මිරිසවැටිය ඉදිකිරීම.
C. අනුරාධපුරය වෙනුවට පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය කර ගැනීම.
D. වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.
E. වසර 44 ක් අනුරාධපුරය පාලනය කිරීම.
F. ශාසනික දියුණුව ඇති කිරීම.

1. ACDF 2. EABD 3. EABF 4. FCAE

14. ලෝහ භාවිත කරමින් කර්මාන්තයන් හී යෙදුන ශිල්පීන් සම්බන්ධ නිරවද්‍ය ප්‍රකාශයන් කවරේදැයි පහත පිළිතුරු අතුරින් තෝරන්න.

A. යකඩ වැඩ කළ කම්මල්කරුවන් "කබර" යන නමින් හැඳින්වීම.
B. තඹ කර්මාන්ත ශිල්පීන් "තබකර" යන නමින් හැඳින්වීම.
C. රන්කරුවන් "තුලාධාර" යන නමින් හැඳින්වීම.
D. ටින් ලෝහ කර්මාන්ත ශිල්පීන් "ලෝතර" යන නමින් හැඳින්වීම.
E. මැණික් කර්මාන්තයේ නියුක්තවූවන් "මණිකර" යන නමින් හැඳින්වීම.
F. නූල් කටින්නන් "නුකබර" යන නමින් හැඳින්වීම.

1. ABCE 2. ACDF 3. ACEF 4. BDEF

15. බෙලිගල පර්වතයෙහි දළදා මාලිගාවක් ඉදිකරමින් දළදා වහන්සේ ආරක්ෂා කරගැනීමට කටයුතු කළ දෙවන නාගරීකරණ සමයේ බිහිවූ පාලකයා වන්නේ,

1. IV වන බුවනෙකබාහු රජතුමා ය.
2. II වන පරාක්‍රමබාහු රජතුමා ය.
3. III වන වික්‍රමබාහු රජතුමා ය.
4. III වන විජයබාහු රජතුමා ය.

16. පහත සඳහන් ප්‍රකාශ අතුරින් VI වන පරාක්‍රමබාහු රජතුමාගේ සේවාවන් නො වන පිළිතුර තෝරන්න.

A. සපුමල් කුමරු යටතේ යාපනය ට හමුදාවක් යවා එය ජය ගැනීම.
B. ඉන්දියාවේ විජය නගර් අධිරාජයාගේ තොටුපලක් ආක්‍රමණය කිරීම.
C. මහනුවර අස්ගිරි සේනාසනය ආරම්භ කිරීම.
D. වෙළඳ ගනුදෙනුවක් මුල්කරගෙන දකුණු ඉන්දියාවේ අදිවීරරාම පටුන ආක්‍රමණය කිරීම.
E. නිශ්ශංක අලකේශ්වරගේ උපකාරයෙන් පාලනයට පත්වීම.

1. AF 2. AD 3. CE 4. DB

17. ක්‍රි.ව. දහතුන්වන සියවසේ රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු යාපන ප්‍රදේශය ආශ්‍රිතව බිහි වූ යාපන රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ,

1. විජය කුලංකෙ ආර්ය චක්‍රවර්තී ය.
2. කුලශේකර ආර්ය චක්‍රවර්තී ය.
3. වරෝදය ආර්ය චක්‍රවර්තී ය.
4. මාර්තණ්ඩ ආර්ය චක්‍රවර්ති ය.

18. යාපහුව රාජධානියෙහි පියගැට පෙළ හා එහි කුලුනු නිර්මාණය සඳහා යොදාගෙන ඇති අභාසය වන්නේ,

1. පාණ්ඩ්‍ය ය
2. කාම්බෝජය
3. පාණ්ඩ්‍ය හා කාම්බෝජය
4. පල්ලව

19. ලංකා තිලකය හා ගඩලාදෙණි විහාර ඉදිකරවන ලද රජතුමා වන්නේ,

1. II වන බුවනෙකබාහු රජතුමා ය.
2. III වන වික්‍රමබාහු රජතුමා ය.
3. IV වන බුවනෙකබාහු රජතුමා ය.
4. ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා ය.

20. "චෙන් හෝ" සෙනෙවියා විසින් ස්ථාපිත කළ ගාල්ලේ "ත්‍රිභාෂා" ලිපිය සඳහා යොදාගෙන ඇති භාෂාවන් මොනවාද?

1. සිංහල, පර්සියානු, චීන භාෂා
2. චීන, ඉංග්‍රීසි, සිංහල භාෂා
3. චීන, පර්සියානු, දෙමළ භාෂා
4. සිංහල, දෙමළ, චීන භාෂා

21. අරාබි ජාතික ඉබන් බතුතා ලංකාවට පැමිණෙන විට මෙරට පාලකයා වූයේ,

1. IV වන බුවනෙකබාහු රජතුමා ය.
2. V වන පරාක්‍රමබාහු රජතුමා ය.
3. සාවුළු විජයබාහු රජතුමා ය.
4. III වන වික්‍රමබාහු රජතුමා ය.

22. මහනුවර රාජධානියෙහි නායක්කර් වංශික ආරම්භක රජතුමා වන්නේ,

1. රාජාධිරාජසිංහ රජතුමා ය.
2. ශ්‍රී විජය රාජසිංහ රජතුමා ය.
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.
4. ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා ය.

23. පළමුවන විමලධර්මසූරිය රජතුමා මුහුණදුන් අභියෝගයක් නො වන්නේ,

1. නීත්‍යානුකූල රාජ්‍ය උරුමයක් නො වීම.
2. උඩරට රාජධානිය පෘතුගීසි ග්‍රහණයෙන් බේරාගත යුතු වීම.
3. පරිහානියට පත් බුදුසසුන නගා සිටුවිය යුතු වීම.
4. තමාගෙන් පසු පාලනයට පත් කිරීමට නියෝජිතයෙකු නො වීම.

24. ප්‍රථම ඉංග්‍රීසි නියෝජිතයා වූ "ජෝන් ෆයිබස්" පැමිණෙන විට උඩරට පාලකයා වූයේ,

1. රාජාධිරාජසිංහ රජතුමා යි.
2. වික්‍රම රාජසිංහ රජතුමා යි.
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා යි.
4. ශ්‍රී විජය රාජසිංහ රජතුමා යි.

25. ක්‍රි:ව: 1602 දී පෘතුගීසීන් හා උඩරැටියන් අතර පැවති බලන සටනෙහි ප්‍රතිඵලයක් වන්නේ,

1. I වන විමලධර්මසූරිය රජු කුසුමාසන දේවිය විවාහ කරගෙන උඩරට පාලකයා ලෙස බලය තහවුරු කර ගැනීම ය.
2. I වන විමලධර්මසූරිය හා උඩරට ජනයාගේ ගරිල්ලා සටන් ක්‍රම නිසා පෘතුගීසි හමුදා පරාජය වීම ය.
3. පෘතුගීසීහු අන්ත පරාජයක් ලැබූ අතර අනතුරු ව ඔවුහු උඩරටට ආක්‍රමණ එල්ල නොකිරීම ය.
4. II වන රාජසිංහ රජු සටන් කර පෘතුගීසි බලපෑමෙන් උඩරට ආරක්ෂා කර ගැනීම ය .

26. II වන රාජසිංහ රජු හා ලන්දේසින් අතර අත්සන් කළ 1638 ගිවිසුමේ ප්‍රතිඵලයක් නො වන්නේ,

1. ලන්දේසින්ගේ ආධාරමත පෘතුගීසින් ලංකාවෙන් පලවා හැරීම ය.
2. සමහර පෘතුගීසි ප්‍රදේශවල ලන්දේසින් බලවත් වීම ය.
3. II වන රාජසිංහ රජු හා ලන්දේසි අතර අමනාපයක් ඇතිවීම ය.
4. යුධ වියදම් කුරුඳු, ගම්මිරිස් ආදියෙන් ගෙවීමට රජු එකඟ වීම ය.

1. ACDE 2. DEAC 3. CACB 4. EBCD

27. බ්‍රිතාන්‍ය ජාතික රොබට් ඇන්ඩෘස් උඩරටට පැමිණෙන විට එහි පාලකයාව සිටි රජතුමා වන්නේ,

1. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.
2. ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා ය.
3. රාජාධිරාජසිංහ රජතුමා ය.
4. I වන විමලධර්මසූරිය රජතුමා ය.

28. පහත සඳහන් ප්‍රකාශ අතුරින් කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වලට පමණක් අදාල තොරතුරු ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A. දිවයින පළාත් පහකට බෙදීම.

B. වාර්ෂික නියෝජන ක්‍රමය අහෝසි කිරීම.

C. රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම.

D. අනිවාර්යය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම.

E. ඡන්ද බලයෙන් නියෝජිතයින් පත්කර ගැනීමට අවස්ථාව ලැබීම.

1. BCAE 2. CBED 3. DCAB 4. DEAB

29. 1848 දෙවන නිදහස් අරගලයට බලපෑ දීර්ඝ කාලීන හේතුව වන්නේ,

1. කොල්බෲක් ප්‍රතිසංස්කරණ ය.
2. 1815 උඩරට ගිවිසුමය.
3. ටොරින්ටන් ආණ්ඩුකාරයාගේ බදු ප්‍රතිපත්තිය ය.
4. ද්විත්ව පාලනය අහෝසි කිරීම.

30. රත්මලානේ පරමධම්ම චෛතිය පිරිවෙන සහ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීමට පුරෝගාමී වූවන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. රත්මලානේ ධම්මාලෝක හිමි, අනගාරික ධර්මපාල තුමා
2. වලානේ සිද්ධාර්ථ හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
3. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, හෙන්රි ඕල්කට් තුමා
4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, වලානේ සිද්ධාර්ථ හිමි

31. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් නො වන්නේ,

1. සර්වජන ඡන්ද බලය ලබා දීම.
2. රාජ්‍ය මන්ත්‍රණ සභාව හඳුන්වා දීම.
3. විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම.
4. ව්‍යවස්ථාදායකය හා විධායක සභා අහෝසි නො කිරීම.

32. පහත සඳහන් ලක්ෂණ අතරින් 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයන්හී ලක්ෂණයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A. ප්‍රථමවරට සීමිත ඡන්දයෙන් නියෝජිතයන් පත්කිරීම.

B. විධායකය අහෝසි කිරීම.

C. උගත් ලාංකිකයෙකු වෙනුවෙන් එක් නියෝජිතයෙකු පත් කිරීම.

D. නිලලත් පිරිස ව්‍යවස්ථාදායකයේ බහුතරය වීම.

E. රාජ්‍ය නිලධාරී තිදෙනාගේ බලතල සීමාවීම.

1. ACD 2. ACF 3. BDE 4. CDE

33. පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. 1952 - මැතිවරණයෙන් ඩඩ්ලි සේනානායක මහතා ප්‍රථම වරට අගමැති ලෙස පත්විය.
2. 1960 - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය අගමැති ලෙස පත්විය.
3. 1947 - සෝල්බරි ව්‍යවස්ථාවට අනුව ඩී.එස්.සේනානායක මහතා ප්‍රථම අගමැති ලෙස පත්විය.
4. 1956 - එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා අගමැති වුවද 1959 දී චීවරධාරියෙකු විසින් ඝාතනයට ලක්විය.

34. මහවැලි ව්‍යාපාරයේ කොත්මලේ, වික්ටෝරියා සහ රන්දෙණිගල ජලාශ සඳහා ආධාර දුන් රටවල් පිළිවෙළින් සඳහන් පිළිතුර කුමක් ද?

1. ස්විඩනය, බ්‍රිතාන්‍ය, නැගෙනහිර ජර්මනිය
2. නොර්වේ, බ්‍රිතාන්‍ය, ජර්මනිය
3. නොර්වේ, බෙල්ජියම, බ්‍රිතාන්‍ය
4. ස්විඩනය, බ්‍රිතාන්‍ය, බටහිර ජර්මනිය

35. යුරෝපයේ දේශගවේෂණ ව්‍යාපාරයට ආසන්න ම හේතුව වන්නේ,

1. ධනවතුන් බිහිවීම හා ඔවුන්ගේ අනුග්‍රහය ලැබීම.
2. වෙළඳාමේ ඇති වූ දියුණුව.
3. කොන්ස්තන්ති නෝපලය තුර්කිවරු සතුවීම.
4. මානවවාදය වැදගත් කොට සැලකීම.

36. යුරෝපා පුනරුදය සමයේ විද්වතුන් සහ ඔවුන්ගේ විරුදනාම "අ ", "ආ" තීරුවල සඳහන්ය. ඒවා නිවැරදිව ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. මානව වාදයේ පියා | A. ඉතාලි ජාතික අලගියර් ඩාන්ටේ |
| 2. ඉතාලි සාහිත්‍යයේ පියා | B. ඉංග්‍රීසි ජාතික ගැලිලියෝ ගැලීලි |
| 3. ඉංග්‍රීසි සාහිත්‍ය නව උදාවේ පහන් තරුව | C. ඉංග්‍රීසි ජාතික ප්‍රැන්සිස් බේකන් |
| 4. අත් හදා බැලීමේ පියා | D. පෝලන්ත ජාතික නිකලස් කොපර්නිකස් |
| | E. ඉතාලි ජාතික පෙට්රාක් |

1. ACDE 2. EBCD 3. DEAC 4. EACB

37. කාර්මික විප්ලව සමයේ නව සොයා ගැනීම් හා එම විද්‍යාඥයින් "අ", "ආ" තීරුවල සඳහන් ය. එම තීරු ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. දුම්නැව | A. ජෝන් කේ. |
| 2.වාෂ්ප එන්ජිම | B. හෙන්රි කෝට් |
| 3.දුවන නඩාව | C. ජෝර්ජ් ස්ටීවන්සන් |
| 4.රෝලර් යන්ත්‍රය | D. හෙන්රි බෙල් |
| | E. ජෝන් මැකඩම් |

1. DCAB 2. BCAE 3. DEAB 4. CBED

38. රාජාණ්ඩු විරෝදී හැගීම්වලට නව ජීවයක් ලබා දීමට මුල්වූ ප්‍රංශ දාර්ශනිකයින් පමණක් ඇතුළත් පිළිතුර මින් කුමක්ද?

1. වෝල්ටෙයාර් , කරෙන්ස්කි , රූසෝ
2. රූසෝ , ලෙනින් , වෝල්ටෙයාර්
3. මොන්ටෙස්ක්‍යු , ට්‍රොම්ස්කි , කරෙන්ස්කි
4. වෝල්ටෙයාර් , රූසෝ , මොන්ටෙස්ක්‍යු

39. 1796 ඇමරිකන් විප්ලවයේ සටන් පාඨය වූයේ,

1. සාමය, ඉඩම් හා ආහාර
2. නිදහස සමානාත්මතාව හා සහෝදරත්වය
3. නියෝජිතයන් නැත්නම් බදුත් නැත.
4. සාමය, සමානාත්මතාව හා සහෝදරත්වය

40. දෙවන ලෝක යුද්ධයෙන් පසු ධනවාදය හෝ සමාජවාදය ප්‍රතික්ෂේප කළ රටවල් එක් ව නො බැදි ජාතීන්ගේ සංවිධානය පිහිටු විය. ඒ සඳහා පුරෝගාමී වූයේ,

1. වුඩ්රෝ විල්සන් මහතා
2. ශ්‍රී ජව හල්ලාල් නේරු තුමා.
3.මහත්මා ගාන්ධි තුමා
4. වින්ස්ටන් චර්චිල් මහතා

MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

HISTORY

ඉතිහාසය

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍ර - II



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ඉතිහාසය - II

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 03 යි**

**සැලකිය යුතුයි.**

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

<u>I කොටස</u>

1. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

I. තබ්බෝව වැව, යෝධ වැව, පූනරීන්, ඌරාතොට, සල්වතොට, උතිනගර, දැදුරු ඔය, දුම්බර, ලංකා පටුන, කල්පිටිය , දැදිගම, කැළණි ගඟ ( ලකුණු 12 )

II. කල්කටා, කළු මුහුද, ඉතාලි අර්ධද්වීපය, ටෝකියෝ, තායිවානය, පර්සියන් බොක්ක ( ලකුණු 6 )

(ආ) (i) පහත A,B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ඉන්දියාවට මුලින්ම පැමිණි පෘතුගීසි ජාතිකයා

B - අනුරාධපුරය 'නුරුපුර' ලෙස හඳුන්වා ඇති මූලාශ්‍රය

C - වසභ රජු සමයේ යාපනයට පාලනය කළ යැවු සෙනවියා

D - ලංකාවේ ප්‍රථම නාමික ජනාධිපතිවරයා ( ලකුණු 4 )

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් පිළිතුරු පත්‍රයේ ලියන්න.



(ii) 1. මෙහි දැක්වෙන්නේ කුමක්ද?

2. මෙය සොයාගත් ස්ථානය කුමක්ද?

3. මෙය කිනම් ඓතිහාසික යුගයට අයත්ද?

4. මෙය භාවිතා කළේ කුමන සමාජ පන්තියක්ද? ( ලකුණු 4 )



(iii) 1. 'B' රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුද?

2. ඔහු නායකත්වය ගත් සටන කුමක්ද?

3. ඔහුට ඉංග්‍රීසීන් ලබාදුන් දඬුවම කුමක්ද?

4. ඔහුගේ මෙහෙයවීමෙන් උඩරට රජු ලෙස පත්කළේ කවුරුන්ද? ( ලකුණු 4 )

<u>II කොටස</u>

2. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් ශාකමය ආහාර වර්ග තුනක් නම් කරන්න. ( ලකුණු 3 )

(ii) පහත ඒවායේ අදහසට අනුව භාවිතා කළ ගම් මොනවාද?

a - වරාය ආශ්‍රිත ගම්

b - අත්හැර දැමූ ගම්

c - ගොවියන් විසූ ගම්

d - වඩුවන් විසූ ගම් ( ලකුණු 4 )

(iii) පූර්ව ඓතිහාසික යුගයේ භාවිතා කළ තාක්ෂණයට අදාළ ලක්ෂණ දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. ( ලකුණු 5 )

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල දක්නට ලැබුනු සුවිශේෂී ලක්ෂණ තුනක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

( ලකුණු 6 )

3. (i) වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරන්න.

a - ප්‍රථම වතාවට ලංකාව එක්සේසත් කරවීම.

b - මුලින්ම කතරගම මුල් කරගෙන පාලනයට පත්වීම.

c - කාලිංග වංශික පාලකයෙක් වීම

( නිශ්ශංකමල්ල රජු, මහා විජයබාහු රජු, දුටුගැමුණු රජු ) ( ලකුණු 3 )

(ii) ශ්‍රී ලංකාවේ අතීතයේ දී පහත කාර්යයන් ආශ්‍රිතව අයකළ බදු වර්ග හැඳින් වූ නම් වරහන් තුළින් තෝරා ලියන්න.

a - රට අභ්‍යන්තරයේ මසුන් අල්ලන අයගෙන්

b - හේන් වගා කල අයගෙන්

c - රජුගේ ඉඩම් වගා කළ අයගෙන්

d - රජුගේ වැව් වලින් ජලය සපයා ගත් අයගෙන්

( බොජකපති, දකපති, මතරමජිබක, කැති අඩ ) ( ලකුණු 4 )

(iii) අතීතයේ ශ්‍රී ලංකාවේ රාජ්‍යත්ව සංකල්පය ශක්තිමත් වූයේ ගෘහපතින්ගෙන් ආරම්භ වූ පාලනයේ විකාශයත් සමඟය. ඒ අනුව, අතීත රජවරුන් සතු වූ වගකීම් හා කාර්යභාරයන් දෙකක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. ( ලකුණු 5 )

(iv) දීර්ඝකාලිනව පැවති අනුරාධපුර රාජධානියට මූලික අඩිතාලම ලබාදෙමින් එය ශක්තිමත් කිරීමට පණ්ඩුකාභය රජු කටයුතු කළ ආකාරය නිදසුන් තුනක් යටතේ විස්තර කරන්න. ( ලකුණු 6 )

4. (i) පහත සඳහන් ඇළ මාර්ග ඉදිකළ රජවරු නම් කරන්න.

a - අංගමැඩිල්ල ඇළ

b - ඇළහැර ඇළ

c - යෝධ ඇළ ( ලකුණු 3 )

(ii) පහත කරුණුවලට අදාළ නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

a - වැවේ අතිරික්ත ජලය බැහැර කිරීම.

b - රළ පහරින් වැව් බැම්ම ආරක්ෂා කිරීම.

c - වැවේ ජලය ඈත ප්‍රදේශවලට රැගෙන යාම.

d - කුඩා වැව් එක්කොට වැව් පද්ධතියක් තැනීම.

( සොරොව්ව, පිටවාන, ඇළ, අමුණු, සළපනාව, වැව් ප්‍රපතනය ) ( ලකුණු 4 )

(iii) අතීතයේ ගමික සතු කාර්යභාරයන් දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. ( ලකුණු 5 )

(iv) මෙරට වාරිකර්මාන්තයේ ප්‍රගතිය උදෙසා වසභ රජුගෙන් සිදු වූ සේවාවන් තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. ( ලකුණු 6 )

5. (i) දෙවන නාගරීකරණ සමයේ බිහි වූ අවසන් රාජධානි තුන නම් කරන්න. ( ලකුණු 3 )

(ii) පහත කරුණු වලට අදාල රජවරු වරහන් තුළින් තෝරා ලියන්න.

a - ජාවක රජෙකු වූ චන්ද්‍රබානු පරාජය කිරීම.

b - ඇම්බැක්කේ දේවාලය ඉදිකිරිම.

c - සිංහල සංගෙ නම් සටන මර්දනය කිරීම.

d - පෘතුගීසින් පැමිණෙන විට කෝට්ටේ පාලකයාව සිටීම. ( ලකුණු 4 )

( VI වන බුවනෙකබාහු රජු, III වන වික්‍රමබාහු රජු, II වන පරාක්‍රමබාහු රජු, VIII වන වීර පරාක්‍රමබාහු රජු, III වන වික්‍රමබාහු රජු )

(iii) III විජයබාහු රජු දෙවන නාගරීකරණය තුළ බිහි වූ වැදගත් පාලකයෙකි. දේශපාලන හා ආගමික සේවාවන් යටතේ මෙය පැහැදිලි කරන්න. ( ලකුණු 5 )

(iv) මෙරට කෝට්ටේ යුගය තුළ සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය උදා වීමට හේතු වූ කරුණු තුනක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. ( ලකුණු 6 )

6. (i) උඩරට රාජධානියේ පාලකවරු අතරින් පහත සඳහන් කරුණු වලට අදාල රජවරු නම් කරන්න.

a - උඩරට රාජධානියේ ආරම්භක පාලකයා

b - ක්‍රි.ව. 1796 දී ඉංග්‍රීසීන් මෙරටට පැමිණෙන විට උඩරට සිටි පාලකයා

c - ගන්නෝරු සටනින් පෘතුගීසින් පරාජය කළ පාලකයා ( ලකුණු 3 )

(ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආගමික සේවා දෙකක් ලියා දක්වන්න. ( ලකුණු 4 )

(iii) මහනුවර රාජධානිය යටත් කර ගැනීමට පෘතුගීසින් ගත් උත්සාහයන් දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. ( ලකුණු 5 )

(iv) I විමලධර්මසූරිය රජුගෙන් සිදු වූ දේශපාලන, ආගමික හා ආර්ථික සේවාවන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

( ලකුණු 6 )

7. (i) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

a - ලංකාවේ අවසන් ලන්දේසි ආණ්ඩුකාරවරයා

b - ඉංග්‍රීසීන් විසින් වෙල්ලෝරයට පිටිවහල් කළ රජු

c - පංච මහාවාද මෙහෙය වූ භික්ෂුව ( ලකුණු 3 )

(ii) පහත සඳහන් කරුණු වලට අදාල පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

a - 1848 අරගලයට ආසන්නම හේතුව ගොඩනැගීම.

b - උදයභාණු පුවත්පත ඇරඹීම.

c - ලංකාවේ ප්‍රථම තේ වත්ත ආරම්භ කිරීම.

d - නිදහස් ලංකාවේ ප්‍රථම අගමැති වීම ( ලකුණු 4 )

( ඩී.එස්.සේනානායක මහතා, ජේම්ස් ටේලර්, ජේ.ආර්.ජයවර්ධන මහතා, ආරුමුග නාවලර් තුමා, සිද්දි ලෙබ්බෙ මහතා, ටොරින්ටන් සාමි )

(iii) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න.

( ලකුණු 5 )

(iv) නිදහසින් පසු මෙරට ආර්ථික අභිවෘද්ධිය උදෙසා බිහි වූ මහවැලි යෝජනා ක්‍රමයේ අරමුණු තුනක් පැහැදිලි කරන්න. ( ලකුණු 6 )

## <u>III කොටස</u>

8. (i) බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය දහනවවන සියවස වනවිට පැතිරී ගිය යුරෝපා රටවල් තුනක් නම් කරන්න. ( ලකුණු 3 )

(ii) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු දෙකක් ලියා දක්වන්න. ( ලකුණු 4 )

(iii) බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය තුළින් බිහි වූ කෘෂිකාර්මික විප්ලවය "වැඩිවන ජනගහනයට අවශ්‍ය ආහාර නිපදවීමට සමත් විය." මෙය කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න. ( ලකුණු 5 )

(iv) බ්‍රිතාන්‍යයේ ඇති වූ කාර්මික විප්ලවයේ බලපෑම ශ්‍රී ලංකාව තුළ ඇති කළ යහපත් හා අයහපත් ප්‍රතිඵල උදාහරණ සහිතව විස්තර කරන්න. ( ලකුණු 6 )

9. (i) දෙවන ලෝක මහා සංග්‍රාමයේ දී අක්ෂ පක්ෂයට අයත් වූ රටවල් තුනක් නම් කරන්න. ( ලකුණු 3 )

(ii) පහත සඳහන් කරුණු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියා දක්වන්න.

a - පළමු ලෝක යුද්ධයේ දී ජර්මනිය විසින් විනාශ කළ ඇමරිකානු නැව

b - දෙවන ලෝක යුද්ධයේ දී ඇමරිකාව මුලින්ම ප්‍රහාර එල්ල කළ ජපානයේ නගරය

c - පළමු ලෝක යුද්ධයේ දී මධ්‍යම බලවතුන්ගේ පිලේ සිට මිත්‍ර පිලට එක් වූ එකම රට

d - දෙවන ලෝක යුද්ධය සමයේ ලංකාවට බෝම්බ හෙලූ ආසියාතික රට ( ලකුණු 4 )

(iii) පළමු ලෝක යුද්ධයට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )

(iv) දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස ලෝක ආර්ථිකය තුළ ඇති වූ බිඳ වැටීම කරුණු තුනක් යටතේ විස්තර කරන්න. ( ලකුණු 6 )

MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

HISTORY

ඉතිහාසය

# ANSWER PAPER -I, II

# පිළිතුරු පත්‍රය - I, II



අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව The National e-learning Portal for The General Education

# I කොටස

| | | | |
|---|---|---|---|
| 1 – 2 | 11 – 2 | 21 – 1 | 31 – 1 |
| 2 – 1 | 12 – 2 | 22 – 3 | 32 – 1 |
| 3 – 2 | 13 – 4 | 23 – 4 | 33 – 2 |
| 4 – 4 | 14 – 1 | 24 – 1 | 34 – 4 |
| 5 – 1 | 15 – 4 | 25 – 2 | 35 – 1 |
| 6 – 3 | 16 – 3 | 26 – 3 | 36 – 1 |
| 7 – 1 | 17 – 1 | 27 – 2 | 37 – 1 |
| 8 – 2 | 18 – 2 | 28 – 4 | 38 – 4 |
| 9 – 3 | 19 – 2 | 29 – 3 | 39 – 4 |
| 10 – 1 | 20 – 2 | 30 – 2 | 49 – 3 |

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ඉතිහාසය - II

## අ.පො.ස. (සා/ පෙළ) - පිළිතුරු පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 03 යි**

## I කොටස

1. අ (I) ලංකා සිතියම. (II) ලෝක සිතියම.

ආ A- වස්කෝ ද ගාමා B- පනාකඩුව තඹ සන්නස C- ඉසිගිරි D- විලියම් ගොපල්ලව මහතා

(II)

A රූපය

1. පබලු මාලයක්.
2. ඉබ්බන් කටුව.
3. පූර්ව ඓතිහාසික
4. පරුමක/ප්‍රභූ.

B රූපය

1. කැප්පෙටිපොල දිසාව/වීර කැප්පෙටිපොල.
2. 1818 අරගලය.
3. මරණ දඬුවම.
4. දොරේ සාමි.

## II කොටස

(2) (I) වල් දෙල්,කැලෑ කෙසෙල්,දෝතලු ඇට,කිතුල් ඇට.

| (II) | (III) නිවාස තැනීමේ තාක්ෂණය. |
|---|---|
| a - පට්ටාන ගාම. | මැටි තාක්ෂණය. |
| b - ඔල ගම්. | මැටි ඔරු සුසාන. |
| c - කසීකාරගාම. | යකඩ තාක්ෂණය. |
| d - වඩ්ඩකීගාම. | පබලු නිපදවීම. |

(IV)

- වැව් කේන්ද්‍රකොටගෙන ජනාවාස බිහිවීම.
- ගම් පාලනයක් පැවතීම.
- ගමිකගේ නමින් ගම් බිහිවීම(උදා- කඩහවාපිගාම,විහාර වාපිගාම,හුන්දරිවාපිගාම,සුමනවාපිගාම).
- වෘත්තිකයන් අනුව ගම් බිහිවීම(උදා-කසීකාරගාම,ගෝපාලගාම).
- පරික්ඛිත්ත ගම් හා අපරික්ඛිත ගම්

(3) (I)

| (I) | (II) |
|---|---|
| a - දුටුගැමුණු රජු. | a - මතරමජිබක. |
| b - මහා විජයබාහු රජු. | b - කැති අඩ. |
| c - නිශ්ශංකමල්ල රජු. | c - බොජකපති. |

(III) බුදු දහම ආරක්ෂා කිරිම.

විදේශ ආක්‍රමණ වලින් රට නිදහස් කර ගැනීම.

දේශපාලන ස්වාධීනත්වයක් ඇති කිරිම.

ආර්ථික අභිවෘද්ධිය ඇති කිරිම.

(IV)

- අනුරාධපුරය සැලසුම් සහගත නගරයක් කිරිම.
- දසවන රාජ වර්ෂයේදී ග්‍රාම සීමා නියම කිරිම.
- දේවාල,රෝහල්,මංමාවත් ඉදිකිරිම.
- අභය වැව, ජය වැව හා ගාමිණී වැව තැනවීම.

4.

(I) a - මහා පරාක්‍රමබාහු රජු.

b - වසභ රජු.

c - ධාතුසේන රජු.

(II) a - පිටවාන.

b - සළපනාව.

c - ඇළ.

d - වැව් ප්‍රපතනය.

(III)

- ගමේ කටයුතු වලට නායකත්වය දීම.
- වැව නඩත්තු කිරිම.
- ගම් අතර සම්බන්ධතා ඇති කිරිම(උදා විවාහ සම්බන්ධතා)
- ගමේ සාමය පවත්වා ගැනීම.
- ආරවුල් විසඳීම.

(IV)

- වී වගාව දියුණු කිරිම.(උදා- ඉන්දියාවේ කාවේරි පටුනේ ඇතිවූ ආහාර හිඟය පියවීමට මෙරට සහල් නිපදවීම.)
- ඇලහැර ඇළ ඉදිකරවීම.
- වැව් තැනීම,විශාල වැව් තැනිමේ පුරෝගාමීයා වීම
- උදා- මහවිලච්චි වැව, මානකැටිය වැව, නොච්චිපොතාන වැව, හිරිවඩුන්න වැව
- උමං ජල තාක්ෂණය හඳුන්වා දීම

5 (I) කුරුණෑගල,ගම්පොළ,කෝට්ටේ , මහනුවර

(II) a - IIපරාක්‍රමබාහු රජු. b - IIIවික්‍රමබාහු රජු.

c - VIභුවනෙකබාහු රජු (සපුමල් කුමරු). d - VIIIවීර පරාක්‍රමබාහු රජු.

(III) **<u>1 දඹදෙණි රාජධානිය ගොඩනැගීම</u>**

උදා: මාසගෙන් දඹදෙණිය ආරක්ෂා කර ගැනීම, මාස පරාජය කිරීම, නිරිත දිග රාජධානි ආරම්භ කිරීම

**<u>2 ආගමික සේවා.</u>**

- උදා- බෙලිගල පර්වතයේ දළදා මාලිගාවක් ඉදිකරවීම.
- දඹදෙණියේ විජය සුන්දරාරාම විහාරය කරවීම.
- කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කිරීම.
- උපසම්පදාව යලි පිහිටුවීම.

(IV) දේශපාලන ස්ථාවර බව.

උදා- VI පරාක්‍රමබාහු රජු අවසන් වරට රට එක්සේසත් කිරීම, පිරිවෙන් බිහිවීම.
උදා - පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන, කැරගල පද්මාවති පිරිවෙන, වීදාගම සනානන්ද පිරිවෙන.
දක්ෂ කතුවරුන් බිහිවීම.
උදා - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, කැරගල වනරතන හිමි, ඉරුගල් කුලතිලක පිරිවෙන් හිමි.
විදාගම මෛත්‍රී හිමි, වැත්තෑවේ හිමි.

6 (I) a - සේනා සම්මත වික්‍රමබාහු රජු b - රාජාධිරාජසිංහ රජු c - II වන රාජසිංහ රජු

(II)

- සියමෙන් (තායිලන්තය) භික්ෂූන් ගෙන්වා උපසම්පදාව යළි පිහිටුවීම.
- වැලිවිට සරණංකර හිමිට සංඝරාජ පදවිය පිරිනමා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීම.
- මහනුවර දළදා මාලිගවේ පෙරහැරට සතර මහා දේවාල පෙරහැර එක් කිරීම (විෂ්ණු,කතරගම,පත්තිනි,නාථ දේවාල)
- ජෝන් ෆයිබස් ගෙන්වා ලන්දේසීන් පලවා හැරීමට උනන්දු වීම

(III) දන්තුරේ සටන, බලන සටන, රන්දෙණිවෙල සටන , ගන්නෝරු සටන

(IV) <u>දේශපාලන</u>

- දන්තුරේ හා බලන සටනින් පෘතුගීසීන් පරාජය කිරීම.
- පෘතුගීසීන් පලවා හැරිමට උනන්දුවීම.

<u>ආගමික</u>

- මහනුවර දළදා මාළිගාව ඉදිකරවීම.
- වාර්ෂික දළදා පෙරහැර පැවැත්වීම.

<u>ආර්ථික</u>

- වී වගාව හා කපු වගාව දියුණු කිරීම.
- යකඩ කර්මාන්තය දියුණු කිරීම.

7 (I) a - ෆන් එංගල්බෙක් b - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු. c - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි.

(II) a - ටොරින්ටන් සාමි. b - ආරුමුග නාවලර් තුමා. c - ජෙම්ස් ටේලර් d - ඩී.එස්.සේනානායක මහතා.

(III)

- සීමිත ඡන්ද බලය හා සර්ව ජන ඡන්ද බලය
- පාර්ලිමේන්තු පාලන ක්‍රමය හඳුන්වා දීම.
- රාජාණ්ඩු පාලනය බිඳ වැටීම.
- දේශපාලන නායකයන් බිහිවීම.

(IV) ගොවීන්ට ඉඩම් ලබා දීම, රජරට වැව්වලට ජලය සැපයීම, වී වගාව දියුණු කිරීම, සුළු අපනයන බෝග වගාව

III කොටස

8

(I) ප්‍රංශය,ජර්මනිය,බෙල්ජියම,ඔස්ට්‍රියාව,ඇමරිකාව.

(II)

- එය සතු යටත් විජිත වලින් අමුද්‍රව්‍ය සපයා ගත හැකි වීම.
- බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු යකඩ හා වානේ සුලභ වීම.
- යුරෝපයේ ඇති වූ පුනරුදය හා විද්‍යාවේ දියුණුව.
- බ්‍රිතාන්‍ය පිහිටීම.
- ධනවතුන් හා ව්‍යාපාරිකයන් සිටීම.

(III)

- ස්වයංපෝෂිත ආර්ථිකය වෙනුවට වෙළඳපොළ ඉලක්ක කරගත් ආර්ථිකයක් බිහිවීම.
- කුඩා ඉඩම් ඒකාබද්ධ කර මහා පරිමාණ ගොවිබිම් ඉදි වීම.
- ශෂ්‍ය මාරු ක්‍රමය හා කට්ටි මාරු ක්‍රමය යටතේ ඉහල ඵලදාවක් ලබා ගැනීම.
- නව කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ භාවිතයට යොමු වීම.
  උදා- ජෙත් රෝටල් විසින් අශ්වයන් යොදා පේලියට වැපිරීමේ ක්‍රමය හඳුන්වා දීම.
- රොබට් බැක්වෙල්,බැටලු අභිජනන ක්‍රමයක් සොයා ගැනීම.
- ක්‍රි.ව. 1800 දී දකුණු අප්‍රිකාව **ගුවානෝ** පොහොර විශේෂය සොයා ගැනීම.

(IV)

යහපත්

- යටිතල පහසුකම් දියුණුව උදා: මහා මාර්ග, දුම්රිය. බැංකු, වෙලඳපොළ ...
- තරඟකාරී ආර්ථිකයක් බිහිවීම
- කර්මාන්ත ශාලා බිහිවීම
- ධනවතුන්, ආයෝජකයන් බිහිවීම

අයහපත්

- පරිසර දූෂණය
- නාගරීකරණය
- කම්කරු පන්තියක් බිහිවීම
- මුඩුක්කු නිවාසබිහිවීම

9 (I) ජර්මනිය,ඉතාලිය,ජපානය.


(II) a - ලුසිටානියා නැව b - හිරෝෂිමා. c - ඉතාලිය. d - ජපානය.

(III)

- දෙවන විලියම්ගේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය.
- යටත් විජිත සඳහා වූ තරඟය.
- අවි තරඟය හා ජාතිවාදය වර්ධනය වීම.
- බිස්මාර්ක් ප්‍රංශය තනි කිරිමට ගත් උත්සහය
- සරායෙවෝ සිද්ධිය(ආසන්නම හේතුව)

(IV)

- යටත් විජිත වලට නිදහස ලැබීම නිසා අධිරාජ්‍යාවාදීන්ගේ බලය බිඳ වැටිම
- බ්‍රිතාන්‍ය,ප්‍රංශය වැනි රටවල් ණයකරුවන් බවට පත්වීම.
- සුභසාධක කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරිම.
- ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
- උදා-මාර්ෂල් සැලස්ම යටතේ ඇමරිකාව විසින් ජපානය ගොඩ නැගීම.
- සරණාගතයන් පුනරුත්තාපනය කිරිම.


ඌරාතොට
පුනරීන්
යෝධ වැව
ලංකා පටුන
කල්පිටිය
අර්ධද්වීපය
තබ්බෝව
වැව
දැදුරු ඔය
දුම්බර
මීගමු කලපුව
දැදිගම
කැලණි
ගඟ
මිනිහාගල් කන්ද


ඉතාලි අර්ධද්වීපය
කළු මුහුද
ටෝකියෝ
පර්සියන් බොක්ක
කල්කටා
තායිවානය

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440